# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 74 — 1973 අගෝස්තු 24 වැනි සිකුරාදා — 1973.08.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II අ) වැනි ඡෙදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු .. .. .. | 1073 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 1083 |



## තනතුරු — ඇබෑර්තු

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළකරවනු ලබනරාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ වන පොදු කොන්දේසි**

**1. අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1:1 තමා ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම් කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

"ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම ලැබුවෙකි.

1:2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම් කරුවකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙක් වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත්, රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

1:3 නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් අසමත්වීම හේතු කොට ගෙන පරිවාස/පරීක්ෂණ කාලය සහිත සේවය අවසන් කරනු ලැබූ "නව ප්‍රවේශක" රජයේ නිලධාරීන් ව සිටි අය, අංක 640 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අදාළ තනතුරට හෝ සේවයට නියමිත වූ ඉහළම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් වීමට හිමිකම් ලබන අන්දමේ සුදුසුකම් ලබා ගෙන සිටිතොත් මිස, එසේ නොමැති නම්, ඔවුන් ගෙන් ලැබෙන අයදුම් පත් භාරගනු නො ලැබේ.

**2. දීමනා**

2:1 ඒ ඒ තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුපට අතිරේක වශයෙන්, රාජ්‍ය සේවයෙහි නියුක්ත මාසික වැටුප් ලබන සියලුම විවාහක නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ, VIII වැනි පරිච්ඡේදයෙහි 1 වැනි වගන්තියෙහි දක්වා ඇති පදනම මත විවාහක දීමනා වක් ගෙවනු ඇත.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡෙදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. සී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

---


1073——ඝ 70994—15,265 (73/8)

B1අ

2 : 2 (සියලුම දීමනාවන් ද ඇතුලුව) රු. 180 සිට රු. 250 දක්වා මාසික වැටුප්/වේතන ලබන ශ්‍රේණියට අයත් රාජ්‍ය නිලධාරීන්ට මාසික වශයෙන් රු. 7.50 ක විශේෂ දීමනාවක් ගෙවනු ඇත. අවශ්‍ය නැත මෙම දීමනාව ක්‍රමික කිරීමට ඉඩ ඇත.

3. සේවා කොන්දේසි : සාමාන්‍ය

3 : 1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි, වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

3 : 2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අත්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥා පනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

3 : 3 දිවයිනෙහි ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැක.

4. ස්ථිර පත්වීම් දරණ රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

4 : 1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 3 වැනි වගන්තියෙහි සඳහන් කොන්දේසි වලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුත්තාහ :—

4 : 1 : 1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතුයැයි සලකනු ලබන්නේ නම් විනා, එසේ නොමැති නම්, සියලුම පත් කිරීම් අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ, හේතුවක් නොදක්වා සේවය කොලවර කරනු ලැබිය හැකිය.

4 : 1 : 2 රාජ්‍ය සේවයෙහි "නව ප්‍රවේශකයන්" වන සියලුම රාජ්‍ය නිලධාරීහු, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවන් සඳහා, 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතෙහි විධි විධානවලටත්, රාජ්‍යයෙහි භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මකව පවත්නාවූත්, අනාගතයේදී පනවනු ලැබිය හැකි වූත් නීති සහ ව්‍යවස්ථා වෙතොත්, ඒවාටත් අනුකූල විය යුත්තාහ.

4 : 1 : 3 රාජ්‍ය භාෂාවෙන් වැඩ කිරීමට හැකි වන අත්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබා ගන්නා ලෙස සියලුම රාජ්‍ය නිලධාරීන්ට නියම කෙරේ.

4 : 1 : 4 පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත් වීමත්, අවුරුදු දෙකක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි II වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් (අවශ්‍ය නම්), අවුරුදු තුනක් ඇතුළත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙහි III වැනි ශ්‍රේණියෙන් සමත් වීමත් සලපවත්වනු ඇත.

නියමිත කාලසීමාව ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධනයන් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාල සීමාව ඉක්ම් තව මාස හයක කාල සීමාවක් ඇතුළත අපේක්ෂිත පරීක්ෂණයෙන් සමත් වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත් හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත් වන තෙක් හෝ පහත දැක්වෙන 4 : 1 : 5 වැනි වගන්තියෙහි විධි විධානයන් බලපවත්වන තෙක් හෝ අපේක්ෂිත වැටුප් වර්ධනයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේ ය.

4 : 1 : 5 පරිවාස කාල සීමාව අවසානයේදී සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත්, එහි ලා ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයෙහි 12 : 13 වැනි වගන්තියෙහි විධි විධානයන් ක්‍රියාත්මක වනු ඇත.

4 : 1 : 6 සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූ අය විෂයෙහි 4 : 1 : 3, 4 : 1 : 4, සහ 4 : 1 : 5 වැනි වගන්ති අදාළ නොවන්නේ ය.

4 : 1 : 7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාල සීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැක.

4 : 1 : 8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/ තාවකාලික තනතුරු දරන්නාවූද, වෛද්‍ය පරීක්ෂණයට භාජන කරනු ලැබුවා වූද අය හැර) තෝරා ගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

5. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

5 : 1 1972. 01. 01 වැනි දිනට පසු, ස්ථිර සේවයට අයත් තනතුරුවලට හෝ තාවකාලික සේවයට අයත් මාසික වැටුප් සහිත තනතුරුවලට හෝ (දෛනික වැටුප් රේට් ප්‍රමාණයන් ගෙවනු ලබන—සේවකයන් හැරයි) පත් කරනු ලබන සියලුම රාජ්‍ය නිලධාරීන් විසින් තමන්ගේ ඒකාබද්ධ වැටුපෙන් 6% ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේදී ගෙවා ඇති ඒකාබද්ධ වැටුපෙන් සියයට 9%ක් රජය විසින් එම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ඇත. එබඳු තනතුරක් දරන්නකුට (කැමති නම්) තමාගේ මනාපය පරිදි තම මාසික ඒකාබද්ධ වැටුපෙන් තව 6%ක් දක්වා වූ ස්වේච්ඡා දායක මුදලක් එම අරමුදලට ගෙවිය හැක. එහෙත් එම දායක මුදල වෙනුවෙන් රජය විසින් දායක මුදලක් නොගෙවනු ඇත.

5 : 2 1971. 12. 31 වැනි දිනට පෙර රාජ්‍ය සේවයෙහි ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරමින් සිටි රාජ්‍ය නිලධාරීන්, 1972. 01. 01 වැනි දිනට පසු, රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරකට පත් කරනු ලැබුවහොත්, එම තනතුර දරන නිලධාරියාට පමණක් පෞද්ගලික වූවක් වශයෙන් අපේක්ෂිත විශ්‍රාම වැටුප් හිමිකම නොකඩවා භුක්ති විඳීමට ඉඩදෙනු ඇත. එම රාජ්‍ය නිලධාරියා පෙර පරිදිම වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වනු ඇත.

6. යුද්ධ සේවා අනුග්‍රහය

6 : 1 එක්සත් රාජ්‍යයේ යුද්ධාවතීර්ණ හමුදාවන්හි සේවා මුක්ත භටයන්වද සහාය හිති නිවත, ගෙත ප්‍රහාර නිවාරණ සහ මහජනාරක්ෂක සේවාවන්හි පූර්ණ කාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිට තමන්ගේම කැමැත්තෙන් එම සේවාවන්ගෙන් අස් වී නොගිය අයට ද අනෙක් සියලුම සුදුසුකම් තිබෙනම්ද, ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරනම් ද ඔවුන්ගේ එම සේවය සතුටුදායක ලෙස අඛණ්ඩව පැවතියේ නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයසේ වලින්, 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තමන් සේවය කළ කාලයක් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

**7 : 1** රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලුම සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නාවූද රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරට තෝරාගනු ලැබුව හොත් ඒ සඳහා ඔවුන් මුදාහැරිය හැකිද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

**7 : 2** නියමිත වේලාවක නියමිත ස්ථානයකදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

**7 : 3** යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් නවර අන්දමේ හුවා අයථා අනුග්‍රහයක් පැතීම හෝ එකිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සෙකු කරනු ලැබීමට හේතු වනු ඇත.

**7 : 4** අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම්කිසි සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

**7 : 5** මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාව සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම**

**8 : 1** සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවක් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

---

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

විත්තඹු තනතුරක්

කටුනායක, ගුවන් හමුදා රෝහලේ එක් තනතුරක් සඳහා තෝරා පත් කිරීම පිණිස අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයෙහි ලියා 1973.9.8 වෙනිදාට පෙර සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, තැ. පෙ. 594, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " විත්තඹු තනතුර සඳහා අයදුම් පත " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

2. වැටුප් ක්‍රමය.—තනතුරට අයත් වැටුප අවුරුද්දකට රු. 2,640—16 × 60—රු. 3,600 කි. පඩිය අවුරුද්දකට රු. 3,060 සහ රු. 3,240 වන විට කාර්යක්ෂමතා බාධකයන්ට මුහුණ දිය යුතු වෙයි.

3. **වයස් සීමාව.**—අයදුම්කාරියන් 1973.9.8 වන දිනට වයස අවුරුදු 20 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.

4. **අධ්‍යාපනික සහ අභියුක්ත සුදුසුකම්.**—සෑම අයදුම්කාරියකටම මෙහි පහත සඳහන් සුදුසුකම් ඇති බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ii) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(iii) ඊට සමාන වෙනත් විභාගයකින් සමත්ව සිටීම.

(ආ) වෛද්‍ය ආඥා පණතේ (105 වැනි අධිකාරය) 7 වැනි කොටස යටතේ ලියාපදිංචිවූ විත්තඹු සේවිකාවක් විය යුතුය.

(ඇ) මනා චරිතයකින් ද, සෞඛ්‍යයෙන් ද යුක්ත වී සිටීම.

(ඈ) රජයේ හෝ පෞද්ගලික රෝහලක විත්තඹු මාතාවක් ලෙස අඩු වශයෙන් අවුරුදු දෙකක්වත් පළපුරුද්දක් තිබීම.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර තාවකාලික සහ විශ්‍රාම වැටුප් රහිතය. තෝරා ගනු ලබන අයදුම්කාරියට සේවයේ යෙදී සිටින අවස්ථාවලදී ඇඳීමට අවශ්‍ය නිල ඇඳුම් සපයනු ලැබේ.

6. **සේවා කොන්දේසි.**—මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ)වැනි ඡේදයෙහි පළ වී ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනවි.

7. අයදුම් කාරියන් ඔවුන්ගේ අයදුම්පත්වලට මෙහි පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් නොව පිටපත් අමුණා එවිය යුතුයි :—

(1) උප්පැන්න සහතිකය

(2) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය

(3) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රය

(4) අයදුම්කාරියගේ චරිතය හා හැකියාවන් පිළිබඳ ළඟදී ලබාගත් චරිත සහතික දෙකක්

සැ. යු.—(i) දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කාරියන් විසින් චරිතය සහ හැකියාවන් පිළිබඳ මෙම චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැති නමුත් මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සහතිකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.

(ii) එම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවන්නේ නැත.

8. අයදුම් පත් මට හෝ මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියෙකුට පුද්ගලිකව නොඑවිය යුතුයි. පුද්ගලිකව එවනු ලබන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. සෑම අතින්ම මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ. සිවගුරු,
සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි,
ගුවන් හමුදා අණදෙන නිලධාරි වෙනුවට.

මූලස්ථානය,
ශ්‍රී. ලං. ගු. හ,
තැ. පෙ. 594,
කොළඹ.
1973 අගෝස්තු මස 3 වැනි දින.

**විත්තඹු තනතුර සඳහා අයදුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලියුම් ලැබෙන පිළිවෙල :————.

(3) උපන් දිනය හා 1973.9.8 වෙනිදාට වයස :————.

(4) ජාතිය (උත්පත්තියෙන් හෝ ලියා පදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙක්ද කියා සඳහන් කරන්න. ලියා පදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙක් නම් ලියා පදිංචිවූ අංකය සඳහන් කරන්න) :————.

(5) සිවිල් තත්ත්වය :————.

(6) අධ්‍යාපනික සුදුසුකම් :————.

(7) වෘත්තීය සුදුසුකම් :————.

(8) පසුගියෙන් අස් වූ කාලයේ සිට කළ රැකියා පිළිබඳ විස්තර :— (කාල ක්‍රමානුගත පිළිවෙළට)
සේවායෝජකයාගේ නම සහ ලිපිනය :————.
සේවා කාලය :— සිට ———— දක්වා ————.
දරණ තනතුර :————.

(9) ඔබ කෙදිනක හෝ උසාවියෙන් දඬුවම් ලබා හෝ ඇප බඳිනු ලැබ සිටිද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

(10) ඉදිරිපත් කර ඇති චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම්, ලිපිනය සහ තනතුර :————.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

8-884 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයේ අන්දමට තමන්ගේම අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් පත් 1973 සැප්තැම්බර් 25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ, තැ. පෙ. 563, කොළඹ 7" යන ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු අතර පෞද්ගලිකව මා නමට හෝ මෙම කායාීලයේ අන් කිසි නිලධාරියකු නමට නොඑවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 5,736 න් පටන් ගෙන රු. 144 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද, රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් 8 කින් ද, හා රු. 240 වාර්ෂික වැටුප් වැඩිවීම් 6 කින් ද, යුක්තව රුපියල් 9,480 දක්වා උසස් වන වාර්ෂික වැටුප් ක්‍රමයක් මේ තනතුරට අයත් වේ. රු. 6,780, රු. 7,500 හා රු. 8,280 වාර්ෂික වේතනයන්ට පළමු නියම කරන ලද කායාීක්ෂමතා කඩ ඉම් විභාගයන්ගෙන් සමත් විය යුතුය. තවද පත්වීම් ලබන අයදුම්කරුවෝ ඉහත සඳහන් කායාීක්ෂමතා කඩඉම් වලින් ඔබ්බට උසස් වීම් ලබනු සඳහා දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන හෝ වෙනත් නියම කරනු ලබන විභාග ආදියෙන් සමර්ථ විය යුත්තෝ වෙති.

3. **සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂක යෝ තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්ව පත් කරනු ලබත්.

(අ) තෝරාගනු ලබන අයදුම්කරුවකු දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන්නෙහි නම් ඔහුට තවදුරටත් විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබෙන අතර, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂකයකුම ඔහු හෝ ඇය පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ලාංකිකයකු බව :

(ආ) 73.09.25 දිනට අවුරුදු 22 ට නො අඩු හෝ අවුරුදු 35 ට නොවැඩි බව (උපාධිධාරි අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ මෙම දෙපාර්තමේන්තුවේ පුහුණුව ලැබූ උපාධිධාරි අභ්‍යාස ලාභීන්ගේ අයදුම් පත් සහ මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු උපාධිධාරීන්ගේ අයදුම් පත් ද, වයස් සීමාව නොසලකා සැලකිල්ලට භාජනය කරනු ඇත.) ;

(ඇ) සංඛ්‍යාති, ගණිතය, අර්ථශාස්ත්‍රය, ප්‍රජාවිද්‍යාව, සමාජවිද්‍යාව හෝ මානව විද්‍යාව සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ඇති බව (ගෞරව උපාධිධාරීන් කෙරේ වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.)

(ඈ) ඉතා හොඳ චරිතයක් ඇති බව.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් පරිදි තමාගේ සහතික පත්‍රවල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි :—

(i) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපත (බව්තීස්ම කිරීමේ සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා රීති අනුව නිකුත් කරන ලද උප්පැන්න සහතිකවල පිටපත් භාර ගනු නො ලැබේ.) ;

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපන හෝ වෘත්තීය සහතික වල පිටපත් ;

(iii) මෙම තනතුර සඳහා අයදුම්කරු තමාගේ අධ්‍යාපනික සුදුසුකම්, චරිතය, හැකියාව සහ වෙනත් සුදුසුකම් මත ලැබූ චරිත සහතික තුනක පිටපත් (මේ ඡේදය අනුව, දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් සහතික පත් ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් මුල් සහතික පත්‍ර පෞද්ගලිකව පවත්වන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු විනා තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් නොකළ යුතුයි.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල පළකර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි ද බලන්න.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1973 අගෝස්තු මස 08 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව—සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරන තනතුර හා ඒ ප්‍රසිද්ධ කරන ලද නිවේදනයට සැසඳුම :————.

2. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.
(ඉතා පැහැදිලි ලෙස ලියන්න)

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
1973.09.25 දිනට වයස අවුරුදු :——. මාස :——. දින :——

4. විවාහක නම් විවාහවූ දිනය හා ළමයින් ගණන :————.

5. අධ්‍යාපනික සුදුසුකම් හා උපාධිය ලැබීම සඳහා ගත් විෂයයන් :————.

(සමර්ථ වූ දිනය හා ප්‍රධාන විෂයය වෙන් වෙන්ව සඳහන් කරන්න)

6. ඉගෙනීම ලැබූ විද්‍යාලයයන් හා එයින් අස්වූ දිනය :————.

7. දැනට යෙදී සිටින රක්ෂාව හා දැනට ලබන වාර්ෂික වැටුප :————.

8. පාඨශාලා හැරයාමෙන් පසු යෙදී සිටි රක්ෂා හා ඉන් අස්වූ දිනය :————.

(රජයේ සේවයක යෙදී සිටියේ නම් ඒ පිළිබඳ සියලු තොරතුරු සඳහන් කළ යුතුයි)

9. සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිවර්තනය පිළිබඳ ප්‍රවීනතාවය :————.

(සමර්ථවූ විභාග පිළිබඳ තොරතුරු සඳහන් කළ යුතුයි.)

10. විශේෂ සුදුසුකම්, (වෘත්තීය, කාර්මික, ක්‍රීඩා, බාලදක්ෂ කටයුතු සමාජ සේවා වැඩ, ශුභසාධක වැඩ) :————.

11. සංඛ්‍යාලේඛන පිළිබඳ පළපුරුදුකම් විස්තර :————.

12. පිටපත් අමුණා ඇති චරිත සහතික ලබාගත් අයවලුන් තිදෙනකුගේ නම් හා ඔවුන්ගේ නිලතල :————.

13. අයදුම්කරු පුද්ගලික වශයෙන් හඳුනන දෙදෙනෙකුගේ නම් හා ඔවුන්ගේ නිලතල (සහතික ලබාගත් අයගේ නම් හැර) :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-883 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඊඑස්. 1/16/4.

## ඉංජිනේරු සේවා මණ්ඩලය

### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ සිවිල් ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු

අංක 72 හා 1973 අගෝස්තු මස 10 වැනි දින දරන, ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළවූ ඉහත සඳහන් නිවේදනයෙහි සිංහල පිටපතෙහි පළමුවන හා හතරවන ඡේදවල, "1973 අගෝස්තු මස 15" යනුවෙන් සඳහන් දිනය, "1973 අගෝස්තු මස 31" යනුවෙන් සංශෝධනය කරනු ලැබේ.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය,
මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 අගෝස්තු මස 14 වැනි දින.

8-945 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

වරාය යාත්‍රා පිළිබඳ සහකාර අධිකාරී තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවමින් 1973 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1973.07.20 දින දරන මගේ දැන්වීම මෙයින් අවලංගු කරමි.

ජී. පී. බී. ද සිල්වා,
වැඩ බලන වරාය කොමසාරිස් වෙනුවට.

1973 අගෝස්තු මස 10 දින,
කොළඹ 1, වරාය කොමිෂන් සභාවේදී.

8—933 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල ප්‍රදර්ශක තනතුරු

වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල පහත දැක්වෙන වෘත්තීන් සම්බන්ධයෙන් ප්‍රදර්ශක තනතුරු සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 1973 සැප්තැම්බර් මස 17 වන දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ කම්කරු කොමසාරිස් (වෘත්තිය අභ්‍යාස) කම්කරු, මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 5 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (කවරයේ වම් උඩ කෙළවරේ "ප්‍රදර්ශක තනතුරු සඳහා" යන්න ලිවිය යුතු බැව් සලකන්න :—)

(1) පැස්සීම (වායු සහ විදුලි).

(2) මුහුදු යාත්‍රා ඇන්ජින් අලුත්වැඩියා කිරීම.

(3) මෝටර් කාර්මික.

2. **දීමනාව.**—සියල්ල අඩංගු රු. 225 සිට රු. 275 දක්වා වූ මාසික දීමනාවකි.

**සටහන.**—ගෙවන නියම දීමනාවේ ප්‍රමාණය, තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රවීණත්වය අනුව නිර්ණය කෙරේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—පත්වීම කම්කරු කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන පරිදි පළමුවෙන්ම නියමිත කාලපරිච්ඡේදයකට කොන්ත්‍රාත්තු පදනමක් මත වේ. පසුව අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට ඉඩ ඇත.

4. **සේවා කොන්දේසි.**—තෝරා ගනු ලබන අයදුම්කරුවන්—

(අ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පවත්නා සියලුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුයි.

(ආ) මුදලින් රු. 500 බැගින් ඇප තැබිය යුතුයි.

(ඇ) දිවයිනේ ඕනෑම පෙදෙසක සේවයේ යෙදවිය හැක.

5. **අවශ්‍ය සුදුසුකම් :**

(i) සෑම අයදුම්කරුවෙක්ම ලාංකික විය යුතු අතර වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 35 ට වඩා වැඩි නොවිය යුතුය. (රජයේ සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ii) (අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන විභාගයකින් සමත් විය යුතුය.

(ආ) (i) අදාළ වෘත්තිය පිළිබඳ පහත දැක්වෙන පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණකර තිබිය යුතුය :—

(1) කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානයක හදාරනු ලබන පාඨමාලාවක් හෝ,

(2) රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ සමූදාවක් මගින් පාලනය වන පිළිගත් පුහුණු කිරීමේ ආයතනයක හදාරනු ලබන පාඨමාලාවක් හෝ,

(ආ) (ii) මරදානේ කාර්මික විද්‍යාලයේ හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක හෝ හදාරනු ලබන වෘත්තියට අදාල පූර්ණ කාලීන දෑවුරුදු පාඨමාලාවක්,

සහ

(ආ) (iii) රජයේ හෝ වෙනත් පිළිගත් වැඩපොළක සිය වෘත්තියට අදාළ අවුරුදු 5 ක පළපුරුද්දක් ලබාතිබීම.

(iii) විශිෂ්ඨ චරිතයකින් හා යහපත් ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

**සටහන :—**

(i) අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ වෘත්තීය පරීක්ෂණය කින් හා ඉගැන්වීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් පසුවය.

(ii) අදාල වෘත්තියට සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව හෝ පිළිගත් වෙනත් ආයතනයක ප්‍රදර්ශකවරුන් වශයෙන් සේවය කොට පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි විශේෂ යෙන් සලකා බලනු ලබන අතර ඉහත සඳහන් අවුරුදු 5ක පළපුරුද්ද පිළිබඳ සුදුසුකමින් තේරීමේ මණ්ඩලයේ අභිමතය පරිදි ඔවුන් නිදහස් කළහැක.

6. රජයේ සේවයේ දැනටමත් යෙදී සිටින අයදුම්කරුවන් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉල්ලුම් පත්‍ර එවිය යුතු අතර ඉල්ලුම්කරුවන් මේ තනතුරු සඳහා තෝරාගනු ලැබුවහොත් සේවය මුදාහරින බවට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් එකඟ වුවහොත් පමණක් ඔවුන් ගැන සලකා බලනු ලැබේ.

7. අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර වලට පහත සඳහන් සහතික පත්වල පිටපත් (මුල් පිටපත් නොවේ) යාකොට එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය, (අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතිකය හෝ බෞතීස්ම සහතිකය භාරගනු නො ලැබේ.)

(ආ) (1) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(2) වෘත්තිය සම්බන්ධයෙන් අඩු තරමින් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති බවට සහතිකයක්.

(3) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් මෙම සහතිකය ඉදිරිපත් කිරීම අනවශ්‍යය).

අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණයේදී සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය හා වේලාව පසුව දන්වනු ලැබේ.

**ඩබ්ලිව්. එල්. පී. ද මැල්.**
**කම්කරු කොමසාරිස්.**

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 5,
1973 අගෝස්තු මස 14 වැනිදා.

## කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල ප්‍රදර්ශක තනතුරු

* පැස්සීම (වායු සහ විදුලි)/මුහුදු යාත්‍රා ඇන්ජින් අලුත්වැඩියා කිරීම/මෝටර් කාර්මික

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. (අ) 1973.09.17 දිනට වයස : අවු :——. මාස :——. දින ——.
(ආ) උපන් දිනය ————.

4. උපන් ස්ථානය ————.
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

5. ජාතිය :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

7. වෘත්තිය පිළිබඳ සුදුසුකම් :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

8. වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

9. උපදෙස් දිය හැකි භාෂාව :—

(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

10. සහතික දුන් අයගේ නම :————.

11. වෙනත් විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(නුවූවමනා වචන කපා හරින්න.)

*තනතුරු එකකට වැඩි ගණනක් සඳහා ඉල්ලුම්පත්‍ර එවන විට ඒ එක් එක් තනතුරු සඳහා වෙන වෙනම ඉල්ලුම් පත්‍ර එවිය යුතුය.

8-936 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු අධිකාරී තනතුරු

**සුරාබදු දෙපාර්තමේන්තුවේ** සුරාබදු අධිකාරී තනතුරු දෙකක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයට දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරන ලද අයදුම් පත් පහත දැක්වෙන දිනට හෝ එදිනට පෙර, ලේකම්, මුදල් අමාත්‍යාංශය, තැ. පෙ. 500, කොළඹ 1 යන ලිපිනයට ලේඛනගත තැපැලෙන් එවිය යුතුය.

(අ) මෙරට අයදුම්පත්—1973 සැප්තැම්බර් 14

(ආ) පිටරට අයදුම්පත්—1973 සැප්තැම්බර් 21

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "සුරාබදු අධිකාරී තනතුර" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සටහන් :**

(i) ඉල්ලුම්පත්‍රයක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) විදේශ අයදුම්කරුවන්ට තම අයදුම්පත් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට නැතහොත් තමන්ට ආසන්නම රටට පත්කොට ඇති ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට ස්වකීය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ සහ නැව් ගාස්තු :** ශ්‍රී ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවක් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවක් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) මෙම තනතුරු ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරීක්ෂණ කාලයක් පිටය. විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් 71.12.24 දින සහ අංක 42 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අදාල වේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් කොළඹදී හෝ වෙනත් ස්ථානයකදී මාස හයකට නො අඩු කාලයක පුහුණුවීමක් ලැබිය යුතුය. වරින්වර දෙපාර්තමේන්තු විභාගයන් පවත්වනු ලබන අතර, සුදුසුකම් ලැබීමේ විභාගයෙන් සමත් වූ කල, තෙවර්ෂයක පරීක්ෂණ කාලසීමාවකට යටත්ව, අයදුම් කරුවන් සුරාබදු අධිකාරී තනතුරුවලට පත් කරනු ලැබේ. කිසියම් විභාගයකින් සමත් වීමට නොහැකි වුවහොත් කිසිදු දැන්වීමක් නොමැතිව අයදුම්කරුවන් සේවයෙන් නවතා ලීමට යටත් වනු ඇත.

(iii) පුහුණුවීමේ කාලය තුළදී අවශ්‍ය උපකරණ හා සුරාබදු අධිකාරී වශයෙන් පත් වූ විට, නියමිත දෙපාර්තමේන්තු නිල ඇඳුම් තෝරා පත් කර ගත් අයදුම්කරුවන්ට ස්වකීය වියදමින්ම ලබාගැනීමට සිදුවේ. නිල ඇඳුම් හෝ පාවහන් සඳහා විශේෂ දීමනා නොගෙවනු ඇත.

**3. වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය :—

(අ) පුහුණුවීමේ කාලයතුළදී වර්ෂයකට රු. 6,720 (වැටුප්)

(ආ) වර්ෂයකට රු. 8,520 ක් වූ වැටුප් පියවරට පෙරාතුව වූ කාර්යක්ෂමතා කඩඉමක් සහිත හා රු. 6,720 පටන් ගෙන රු. 360 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 12 ක් සහිත වර්ෂයකට රු. 11,040 දක්වා වූ වැටුප් ක්‍රමයකට යටත්ව

4. අවශ්‍ය සුදුසුකම්.—(i) සෑම අයදුම්කරුවකුම පහත දැක්වෙන කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1973.9.14 දින වන විට වයස අවුරුදු 21 ට නො අඩු බව හා අවුරුදු 25 ට නොවැඩි බව. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි මෙම වයස් සීමාව බල පාන්නේ නැත.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු බව.

(ඈ) යටත් පිරිසෙයින් උසින් අඩි 5 අඟල් 6 බවත්, (ආශ්වාස නොකොට) අඟල් 32ක පපුවේ මිනුමක් ඇති බවත්, හොඳ ඇස් පෙනීමකින් හා ශරීරයකින් යුතු බවත් (ඇස් පෙනීම යටත් පිරිසෙයින් 6/6 හා 6/12 විය යුතු අතර වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුයි.)

5. පහත සඳහන් ලියකියවිලිවලින් එකක් හෝ සියල්ලක්ම හෝ ඉල්ලා සිටි විටෙක අයදුම්කරුවන් ඒවා ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (සැ.යු.—බව්තීස්ම සහතික හෝ උප කෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයෙහි කාර්යයන් සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික පිළිගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැන ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්වූ අවස්ථාවක ලිය කියවිලි ඉදිරිපත් කිරීමට නො හැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව කෙළින්ම ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අයදුම්පත් ලැබුණු බව අයදුම්පත් භාර ගන්නා අවසාන දින සිට සති දෙකක් ඇතුළත දී අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. එසේ දැන්වීමක් නොලද හොත් ඉහත සඳහන් ලිපිනයට ලියා විමසන්න.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) වැනි ඡේදයේ මුල් පිටුවේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි කෙරෙහිද අවධානය යොමු කරවනු ලැබේ.

9. අයදුම්පත් සහ ඒ පිළිබඳ සෙසු සියලුම ලියකියවිලි මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතු අතර, මුදල් අමාත්‍යාංශයේ හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුට පෞද්ගලිකව නො එවිය යුතුය.

10. ඉල්ලුම්කරු රෙකමදාරු කිරීමට කැමැති කෙනෙකු වේ නම් ඔහු විසින් ඉල්ලුම්කරුට සහතිකයක් දිය යුතුය. ඉල්ලුම්කරුගේ තෝරා ගැනීම පිළිබඳව දරණ අයථා ප්‍රයත්නයක් වේ නම් ඉල්ලුම් කරු ඒ තනතුරට නුසුදුසු අයෙකුවීමට ඉඩ තිබේ.

සී. ඒ. කුරේ,
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.

මුදල් අමාත්‍යාංශය,
කොළඹ 1, 1973 අගෝස්තු 14 දිනදීය.

### ආදර්ශ අයදුම් පත

### සුරාබදු අධිකාරි තානාතුරක් සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම : (අ) පෙළපත් නාමය :————.
(ආ) අනෙකුත් නම් :————.

2. ලිපිනය :————.

3. ඉතා කිට්ටු පොලිස් ස්ථානය :————.

4. (අ) උපන් දිනය :————.
(ආ) 1973.9.14 දිනට වයස : අවු :——, මාස :——, දවස් :——.

5. ජාතිකත්වය :————.
(අ) ශ්‍රී ලංකා පුරවැසියෙක් නම් පරම්පරාවෙන් ද ලියා පදිංචි කිරීමෙන් ද යන වග :————.
(ආ) පරම්පරාවෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් නම් පහත සඳහන් අය උපන් ස්ථාන සඳහන් කරන්න :—
(i) අයදුම්කරු :————.
(ii) අයදුම්කරුගේ පියා :————.
(iii) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(iv) අයදුම්කරුගේ පිය පස මී මුත්තා :————.

6. විවාහකද ? අවිවාහකද ? නැතහොත් වැන්දඹුද ? :————.
විවාහක නම් විවාහ වූ දිනය හා ළමයින් ගණන :————.

7. ශාස්ත්‍රීය/අධ්‍යාපන සුදුසුකම් :————.

| විභාගය/උපාධිය | වර්ෂය | විෂයයන් |
|---|---|---|
| | | |

8. සිංහල සහ/හෝ දෙමළ කියවීම සහ/හෝ ලිවීම සහ/හෝ කථා කිරීම සම්බන්ධ ප්‍රවීණතාව :————.

9. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ දා පටන් කළ රැකියා පිළිබඳ විස්තර (පත්වූ හා අස්වූ දිනයන් හා ලැබූ වේතනය) :————.

10. නිරතව සිටි කිසියම් බල ඇණියක හෝ සිවිල් ආරක්ෂක අංශයක සේවාවන් පිළිබඳ විස්තර :————.

11. (අ) උස : අඩි :——, අඟල් :——.
(ආ) පපුවේ මිණුම (ආශ්වාස නොකොට) අඟල් :————.
(ඇ) දෘෂ්ටිය :————.

12. තමා නමින් හෝ තම භාර්යාව නමින් චංචල, නිශ්චල දේපල තිබේද ? එසේ නම් ඒවායේ වටිනාකම හා පිහිටා ඇති ස්ථාන සඳහන් කරන්න. නොඑසේ නම් උරුමයෙන් හිමි වේ යයි බලාපොරොත්තු වන දේපල තිබේ ද ? :————.

13. උද්භිද විද්‍යාව හෝ රසායනික විද්‍යාව පිළිබඳ දැනුමක් ඔබට තිබේද ? :————.

14. ඔබට මෝටර් රථයක් සහ/හෝ මෝටර් බයිසිකලයක් පැදවිය හැකිද ? :————.

15. ඔබ මීට ඉහත සුරාබදු දෙපාර්තමේන්තුවේ රැකියාවක් සඳහා ඉල්වූයේ නම් ඒ කවදාද ? ලියකියවිලිවල යොමුව සඳහන් කරන්න :————.

16. කුමන තරාතිරමක හෝ රජයේ රැකියාවක් ඔබ විසින් මීට කලින් කරනු ලැබුවා ද ? එසේ නම් එහි තරාතිරම, කොහේ ද හා එයින් ඉවත් කරන ලද්දේ කුමක් නිසාදැයි සඳහන් කරන්න. (දිනයන් සඳහන් කරමින් විස්තර දක්වන්න) :————.

17. කිසියම් වරදක් හේතු කොට ගෙන ඔබ කවරදා හෝ අධිකරණයේදී වරදකරු වී තිබේද ? නීතියේ රැහැනට අසුවී තිබේද ? එසේ නම් දිනය, ස්ථානය හා විස්තරයන් දක්වන්න) :————.

18. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම් හා පළපුරුදුකම් තිබේ නම් සඳහන් කරන්න :————.

19. චරිත සහතික ලබාගත් අයගේ නම්, තනතුරු හා ලිපින යන් :————.

20. ඔබ ණය බරින් තොරවූවෙක් ද ? නො එසේ නම් ඔබගේ ණය ප්‍රමාණය කෙතෙක් ද ? :————.

21. තවත් සඳහන් කළ යුතු විස්තර :————.

මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති විස්තර සත්‍ය බවටත් නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. මෙහි අඩංගු කරුණු අසත්‍ය බවට හා වැරදි සහගත බවට හෙළි වුවහොත්, එසේ හෙළිවන්නේ තෝරා ගැනීමට පෙර නම්, මා මේ තනතුර සඳහා ඉල්වීමට නුසුදුස්සකු වන බව හා එසේ හෙළිවන්නේ තෝරා පත් කරගත් පසුව නම් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් නවතාලනු ලබන බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයෙහි නිරත නම් ඔහු පිළිබඳව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :—

ඉහත දක්වෙන විස්තර නිවැරදි බවත්, අයදුම්කරුගේ වැඩ සහ හැසිරීම ........................ බවත්, අයදුම්කරු දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවත්, මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

————,
අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සන.

දිනය :————:

8-947—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය

### පුරප්පාඩු

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සේවයේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ෆෝර්මයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1973 සැප්තැම්බර් 8 දිනට හෝ ඊට පෙර, කොළඹ 7, 202 බෞද්ධාලෝක මාවතේ, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ, අතිරේක ලේඛකාධිකාරි වෙත ලේඛිත තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සටහන.**—මෙම තනතුරු සඳහා දක්වා ඇති උපරිම වයස් සීමා වන්, විශ්වවිද්‍යාල, රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු තැනැත්තන් කෙරෙහි බලපානු නොලැබේ.

**1. පොත් තබන්නා**

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රුපියල් 350—18×15—620 (රුපියල් 515 ට පෙර නියමිත විභාගයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි).

**සුදුසුකම්.**—i. දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 6 ක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්විය යුතුය. එසේ සාමාර්ථය ලත් විෂයයනට සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ අංක ගණිතය හෝ ගණිතය ඇතුළත් වියයුතුය.

ii පිළිගත් ආයතනයකින් ලබාගත් පොත් තැබීම පිළිබඳ සුදුසුකම්.

**වයස.**—අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

**2. විනයාරක්ෂක නිලධාරි**

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රුපියල් 350—18×15—620 (රුපියල් 515 ට පෙර නියමිත විභාගයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි)

**සුදුසුකම්.**—i. දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 5ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම හෝ ඊට උසස් සුදුසුකම් ලබා තිබිය යුතුය.

ii. උද්‍යෝගිමත් ක්‍රීඩකයෙක් විය යුතුය.

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**3. මහජන සෞඛ්‍ය පරීක්ෂක**

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රුපියල් 350—18×15—620 (රුපියල් 515 ට පෙර නියමිත විභාගයකින් යුත් කාර්යක්ෂමතා කඩඉමකි)

**සුදුසුකම්.**—i සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත්ව සිටිය යුතුය.

ii. මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක් හෝ ස්කූටරයක් හිමිව තිබීම හෝ එවැනි වාහන පැදවීමට බලපත්‍රයක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වේ.

**වයස.**—අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

4. I ශ්‍රේණියේ ඉලෙක්ට්‍රොනික් කාර්මික

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රුපියල් 640—8×20—රු. 800.

**සුදුසුකම්.**—(අ) i කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ ඉලෙක්ට්‍රොනික් හෝ විදුලි සංදේශ හෝ සමාන කටයුතු පිළිබඳ විශේෂ පුහුණුවක් සහිතව කාර්මික විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සමත්වීම, සහ

ii. මෙම සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අවුරුදු 5 ක පළපුරුද්ද, නැතහොත්

(ආ) i. දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 5ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්විය යුතුය. සම්මාන සාමාර්ථ ලත් විෂයයන්ට භෞතික විද්‍යාව සහ ගණිතය ඇතුළත් වියයුතුය, සහ

ii. ඉලෙක්ට්‍රොනික් උපකරණ පරීක්ෂණය, අළුත්වැඩියා කිරීම සහ පිරිද්දුම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස.**—අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

5. II ශ්‍රේණියේ ඉලෙක්ට්‍රොනික් කාර්මික

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රු. 515—7×15—රු. 620.

**සුදුසුකම්.**—(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ ඉලෙක්ට්‍රොනික් හෝ විදුලි සංදේශ හෝ සමාන කටයුතු පිළිබඳ විශේෂ පුහුණුවක් සහිත කාර්මික විද්‍යා ජාතික ඩිප්ලෝමාව සමත්වීම, හෝ

(ආ) i. දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 5ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්විය යුතුය. සම්මාන සාමාර්ථය ලත් විෂයයනට භෞතික විද්‍යාව සහ ගණිතය ඇතුළත් විය යුතුය, සහ

ii පිළිගත් ආයතනයක ඉලෙක්ට්‍රොනික් උපකරණ පරීක්ෂණය, අළුත් වැඩියා කිරීම සහ පිරිද්දුම පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස.**—අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6. වැඩපොළ කාර්මික

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රු. 515—7×15—රු. 620.

**සුදුසුකම්.**—(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව හෝ සමාන කටයුතු පිළිබඳ විශේෂ පුහුණුවක් සහිතව කාර්මික විද්‍යා ජාතික ඩිප්ලෝමාව හෝ ඊට සමාන සුදුසුකම්, හෝ

(ආ) i දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන 5ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්විය යුතුය. සම්මාන ලත් විෂයයනට භෞතික විද්‍යාව සහ ගණිතය ඇතුළත් විය යුතුය.

ii පිළිගත් කාර්මික අභ්‍යාස ආයතනයකින් වැඩපොළ කාර්මික විද්‍යාව පිළිබඳ සහතිකයක් තිබිය යුතුය.

iii විද්‍යා සහ ඉංජිනේරු විද්‍යා රසායනාගාරයන්හි සියුම් උපකරණ භාවිතය, නඩත්තුව, අළුත්වැඩියාව, සකස් කිරීම සහ අංක සංශෝධනය පිළිබඳව යටත් පිරිසෙයින් පස් වර්ෂයක පළපුරුද්ද.

**වයස.**—අවුරුදු 40 කට නොවැඩි විය යුතුය.

7. පන්ච් ඔපරේටර්

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළත්ව මාසිකව රු. 275—14×15—රු. 485

**සුදුසුකම්.**—දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 5 ක් සහිතව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම—සම්මාන සාමාර්ථ ලත් විෂයය කට භෞතික විද්‍යාව සහ ගණිතය ඇතුළත් විය යුතුය.

**පටහන.**—යෝග්‍යතා පරීක්ෂණයකින් තෝරාගැනීම කරනු ලැබේ.

**වයස.**—අවුරුදු 25 කට නොවැඩි විය යුතුය.

අතිරේක ලේඛකාධිකාරී.

1973 අගෝස්තු 14 දින,
කොළඹ 7,
202, බෞද්ධාලෝක මාවතේ,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේදීය.

**ආදර්ශ අයදුම්පත් ෆෝරමය**

**..............................තනතුර**

1. (අ) මුලකුරු සමග නම :———— .
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
2. තැපැල් ලිපිනය :————.
3. ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ තැපැල්පොළ : ————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :————.
5. අධ්‍යාපන සුදුසුකම් (අ.පො.ස. (සා.පෙ.) විභාගය ආදියේ විෂය යන් සහ ලැබී ඇති සම්මාන ආදිය සඳහන් කළ යුතුය) : ————.
6. වෘත්තීය සුදුසුකම් :————.
7. (අ) ලඝුලේඛන වේගයන්—
   සිංහල :————.
   ඉංග්‍රීසි :————.
   (ආ) යතුරු ලිවීමේ වේගයන්—
   සිංහල :———— .
   ඉංග්‍රීසි :————.
8. සිංහල පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.
9. ඉංග්‍රීසි පිළිබඳව ලබා ඇති උසස්ම සුදුසුකම් :————.
10. පාසැලින් අස්වූ පසු නියුක්ත වූ රැකියාවන් පිළිබඳ විස්තර (කරුණාකර එක් එක් ස්ථානයේ සේවයට බැඳුනු හා අස්වුනු දිනයන් සහ ලද වැටුප් ක්‍රම සහ වැටුප් පියවර වල් සඳහන් කරන්න) :————.
11. දැනට දරණ තනතුර, ස්ථානය, වැටුප් ක්‍රමය සහ වැටුප : ————.
12. අයදුම්කරු පිළිබඳව විමසිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්—
    1.
    2.

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍යවූද නිවැරදිවූද ඒවා බව සහතික කරමි. එමෙන්ම මෙහි සඳහන් විස්තර අසත්‍ය හෝ වැරදි හෝ ඒවා බව තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු වන බවද පත්වීම ලැබුවාට පසු මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි ඒවා බව සොයාගනු ලැබුවහොත්, කිසිම වන්දියක් නොමැතිව මා සේව යෙන් පහ කිරීමට ඉඩ ඇති බවද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-943 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ මීඹයෙන් එගොඩ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ මීඹයෙන් එගොඩ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරි පත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973.09.14 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 7 වන ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන අයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපැලෙන් එවිය යුතු වේ.

වන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 අගෝස්තු මස 14 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව උප දිසාපති කොට්ඨාශයේ මිඹයෙන් එගොඩ කෝරළයේ හදිසි මරණ පරීක්‍ෂක ධූරය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8-969 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා මහ බැංකුව කොළඹ**

**පුරප්පාඩු**

මහ බැංකු සේවාවේ කේන්ද්‍රාපසාරී යන්ත්‍ර ක්‍රියාකරවන්නකුගේ තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පත්වීම්, මුල් අවස්ථාවේදී තාවකාලික පදනමක් මත කැරෙන අතර, සුදුසු යැයි පෙනී ගියහොත්, පත්වීම්ලාභියා බැංකුවේ ස්ථිර සේවාවට බඳවාගනු ලැබේ. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

**සුදුසුකම් :—**

(i) විශාල යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව අඩුම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්ද.

(ii) කේන්ද්‍රාපසාරී ශීතන යන්ත්‍රයක් සහ ඒ ආශ්‍රිත අනෙකුත් උපකරණ ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාප්ත මිදුන ජල ශීතකර ක්‍රමයක් ක්‍රියා කරවීමේ සහ නැවැත්වීමේ වගකීම භාර ගැනීමේ හැකියාව.

(iii) යන්ත්‍රවල මෙහෙයවුම් දෝෂ ලොග් පොත්වල සටහන් කිරීම හා සියළුම උපකරණ පිළිබඳව තොකඩවා ලොග්වල සටහන් පවත්වා ගෙන යෑමේ හැකියාව.

(iv) මනා සෞඛ්‍ය තත්ත්වයක් සහ රාත්‍රි සේවා විඩයන්හි වැඩ කිරීමට හැකියාව හා කැමැත්ත.

(v) ඉංග්‍රීසි භාෂාවෙන් ඇති නිෂ්පාදකයාගේ සේවා සහ අලුත්වැඩියා කිරීම් තොරතුරු ඇතුළත් අත්පොත කියවා තේරුම් ගැනීමේ හැකියාව.

**සැළකිය යුතුයි.**—කේන්ද්‍රාපසාරී ශීතන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

**වයස.**—1973. 09. 05 දිනට අවු. 40 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

රු. 295—රු. 416
රු.7 × 13 සහ රු. 7.50 × 4

**පොදු කරුණු**

(අ) රාත්‍රි සේවා මුරවල වැඩ කළ යුතුය.

(ආ) දින 7 සතියක් ඇතුලත දින 5½ ක කුමන හෝ කාලසීමාවක් වැඩ කරන ලෙස නියම කරනු ලැබේ.

(ඇ) (විවාහක නම්) විවාහක දීමනාවක්ද වැටුපට අමතරව ගෙවනු ලැබේ.

(ඈ) තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුගේ සුදුසුකම් අනුව වැටුප් පරිමාණයේ කිසියම් වැටුප් මට්ටමක් මත තැබිය හැකිය.

(ඉ) අයදුම්පත් පෝර්ම හා වැඩිදුර විස්තර ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතන දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. (අයදුම්පත් පෝර්ම තැපැලෙන් එවිය යුතු නම් තමන්ගේ ලිපිනය ලියා මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් එවිය යුතුය.)

(ඊ) අයදුම්පත් 1973. 09. 05 දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 1, තැ. පෙ. අංක 590, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතන අධ්‍යක්‍ෂ අමතා එවිය යුතුය.

(උ) අයදුම්පත් ලැබුන බව දන්වනු නොලැබේ. එහෙයින්, තම තමන්ගේ අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් එවන සේ අයදුම්කරුවනට උපදෙස් දෙනු ලැබේ.

ආයතන අධ්‍යක්‍ෂ.

ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 1.

8-944 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ නාවෙල කොට්ඨාශයට හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත්කිරීම**

බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ නාවෙල කොට්ඨාශයට හදිසි මරණ පරීක්‍ෂක ධූරය සඳහා මෙහි 3 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් කරුවන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹල්වෙල කොරළයේ, ඉලුක්පැලැස්ස-නාවෙල හා ගවරවෙල යන වසම්වල ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

2. පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම්පත් 1973 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම බදුල්ලේ දිසාපති වෙත එවිය යුතුය.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30කට නොඅඩු හා 60 කට නොවැඩිවීම ;

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම ;

(ඇ) ඉල්ලුම්කරු ඉහත 1 වැනි ඡේදයේ දැක්වෙන ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු වීම ;

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි 7 වැනි ප්‍රමාණයෙන් වත් සමත්ව සිටීම ;

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සහ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඇ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතන වල සේවකයින් හෝ නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට සුදුසු අය නොවෙති.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නො ලැබේ. අයදුම්පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු ය.

එල්. බී. වේරපිටිය,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක ඒජන්ත,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1973 අගෝස්තු 8 දින,
බදුල්ල කච්චේරියේ දිය.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කුඹල්වෙල කෝරළේ-නාවෙල කොට්ඨාශයට හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත් කිරීම**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්)

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : අවු :——, මාසඃ——, දින :——.
(ආ) උපන් දිනය හා ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කලේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපලවල වටිනාකම සහ ප්‍රමාණය විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණය ගැතිව සිටිද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද?

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-880—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**රාජ්‍ය දැව සංස්ථාවේ සිංහරාජ යාන්ත්‍රික දැව හෙළීමේ ව්‍යාපාරය**
**පිරිවැය ගණකාධිකාරී තනතුර**

රාජ්‍ය දැව සංස්ථාවේ සිංහරාජ යාන්ත්‍රික දැව හෙළීමේ ව්‍යාපාරයේ පිරිවැය ගණකාධිකාරී තනතුර සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**වැටුප් ක්‍රමය.**—මසකට සියලු දීමනා සහිතව, රු. 1,000—50—රු. 1,500.

**අධ්‍යයන සුදුසුකම්.**—වැඩ සහ පිරිවැය ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකත්වය හෝ එම ආයතනයේ අවසාන පරීක්ෂණය සමත්වීම හෝ ඊට සමාන සුදුසුකමක්.

**අතිකුත් සුදුසුකම්.**—අයදුම්කරුවන්ට පහත දැක්වෙන විෂයයන්හි පළපුරුද්දක් තිබිය යුතුය :—

(ඒ) ක්‍රම නිර්මාණය හා ක්‍රියාත්මක කිරීම.
(බී) සම්පූර්ණ කළමණාකරණ ගිණුම් වාර්තාවල ක්‍රියාකාරිත්වය.
(සී) සියලුම පරිපාලන මට්ටම් වලට පිරිවැය දත්තයන් පහදාදීම.

2. අයදුම්කරුවන් සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් දෙකෙහිම කථා කිරීමේ හා ලිවීමේ ප්‍රවීනත්වයක් තිබිය යුතුය.

3. නිෂ්පාදන ආයතනයක පිරිවැය ක්‍රමයන් සාතුවුදායක ලෙස ක්‍රියාත්මක කළ හැකි බව දැක්විය හැකි අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**සේවා කොන්දේසි :—**

(1) මෙම තනතුර ස්ථිර එකක් වන අතර තෝරා ගනු ලබන අයදුම්කරු පත්වීම් දිනයේ සිට අවුරුදු 2 ක ආධුනික කාලයකට යටත්වනු ඇත. වැටුපෙන් සියයට 6 ක ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. සංස්ථාව විසින් සියයට 9 ප්‍රමාණයක් ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය දැව සංස්ථාවේ සිංහරාජ යාන්ත්‍රික දැව හෙලීමේ ව්‍යාපාරයට අයත් සේවක පිරිසට බලපාන පොදු සේවා කොන්දේසිවලට යටත් වනු ඇත.

(2) තෝරා ගනු ලබන අයදුම්කරු රජයේ භාෂා ප්‍රතිපත්තිය සහ විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමෙහිලා දැනටමත් පනවා ඇති නීතිරීති මෙන්ම ඉදිරියට පමුණුවනු ලබන නියමයන් ද පිළිපැදීම සඳහා යටත්වනු ඇත.

(3) සුදුසුකම්, පළපුරුද්ද යනාදිය විස්තරාත්මකව සඳහන් කරන ලද අයදුම් පත් කොළඹ 5, වජිර පටුමගේ, අංක 7 දරන ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති වෙත 1973.09.07 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් පත් ලද බව දන්වනු නොලැබේ.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

රාජ්‍ය දැව සංස්ථාව,
7, වජිර පටුමග,
කොළඹ 5.
1973.

8-957 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පරිපාලන අභ්‍යාස ආයතනය—අභ්‍යාස හා පර්යේෂණ ආශ්‍රිත තනතුරු**

අංක 73 හා 73.08.17 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) හි පළ කරන ලද ඉහත සඳහන් ගැසට් නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය 73.09.07 දින දක්වා දීර්ඝ කර ඇති බැව් මින් දන්වමි.

1973 අගෝස්තු 15 වන දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

8-974 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව**

**අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුර**

ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාවේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර 1973 සැප්තැම්බර් මස 10 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

1. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.**—අවුරුදු 3 ක පරිවාස කාල සීමාවකට යටත්ව, මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හිමිය.

2. **වැටුප් පරිමාණය.**—(i) රු. 1,150—50 × 5—රු. 1,400 (මාසික) (මතු දැක්වෙන 4(i) දරණ ඡේදයේ සඳහන් සුදුසුකම් සතු අයට පමණක් අදාල වේ.)
(ii) රු. 800—45 × 7—රු. 1,115 (මාසික) (මතු දැක්වෙන 4 (ii) දරණ ඡේදයේ සඳහන් සුදුසුකම් සතු අයට පමණක් අදාල වේ.)

3. **වයස් සීමාව.**—අවුරුදු 30 ත් 40 ත් අතර වේ. (රජයේ හෝ සංස්ථා සේවකයන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත).

4. **අවශ්‍ය සුදුසුකම්.**—(i) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය (ගිණුම් පරීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත).

හෝ

(ii) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ මධ්‍ය පරීක්ෂණය හෝ 'සර්ටිෆයිඩ් ඇන්ඩ් කෝපරේට්' ගණකාධිකාරීන්ගේ සංගමයේ I, II හා III වෙනි කොටස් වලින් සමත් වීම හා ගිණුම් පරීක්ෂණ කටයුතු පිළිබඳව අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම.

රජයේ හෝ සංස්ථා සේවයේ හෝ නියුක්ත නිළධාරීන්ගේ අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මාර්ග යෙන් එවිය යුතුය.

කේ. ඕ. ඕ. පෙරේරා,
සභාපති.

1973 අගෝස්තු 10 දින,
ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව,
තැ. පෙ. 337,
කොළඹ 7.

**අයදුම් පතෙහි ආකෘතිය**

අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :—(1973 සැප්තැම්බර් 10 දිනට වයස අවුරුදු) : ————.
4. විවාහකද, අවිවාහකද යන වග :————.
5. (i) ජාතිය :————.
   (ii) ලාංකික වූයේ පරම්පරාවෙන්ද? ලියා පදිංචි වීමෙන්ද? : ————.
6. සුදුසුකම් :————.
   (i) ගැසට් නිවේදනයේ 4 වන ඡේදය යටතේ අපේක්ෂා කරනු ලබන සුදුසුකම් අතුරින් ඔබට ඇති සුදුසුකම් පිළිබඳ විස්තර. (සහතික පිටපත් අමුණන්න) :————.
   (ii) ඔබ ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සහතික පිටපත් අමුණන්න) :————.
   (iii) පළපුරුද්ද හා වෙනත් විශේෂ සුදුසුකම් (සහතික පිටපත් (අමුණන්න) :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-978 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ආරෝග්‍යශාලා ලේකම්වරුන්, සඳහා අර්ධ වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973 ඔක්තෝබර්**

ඉහත සඳහන් පරීක්ෂණය පහත සඳහන් දිනවල කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

**ලිඛිත පරීක්ෂණය :**

1973. 10. 27 ආයතන සංග්‍රහය *

1973 10. 27 ආරෝග්‍යශාලා සහ බෙහෙත් ශාලා පරිපාලනය

1973. 10. 27 ගිණුම්.

සිංහල/දෙමළ වාචික පරීක්ෂණය—පරීක්ෂණයේ දිනය විභාග කොමසාරිස් විසින් අපේක්ෂකයන් වෙත දැනුම් දෙනු ලැබේ.

* "රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා සහ කාර්ය සංවිධාන සංග්‍රහය" යනුවෙන් කලින් නම්කර තිබූ ප්‍රශ්න පත්‍රය දැන් "ආයතන සංග්‍රහය" යනුවෙන් නම්කර ඇති බව අපේක්ෂකයන් විසින් සටහන් කරගත යුතුය. මේ විෂයය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේදයන් පිළිබඳ දැනීමක් ඔවුන්ට තිබිය යුතුය :—

**II, III, III(අ), V, VI, VI, VII, IX, XVI, XXI, XXIX, XXX, XXXII, XXXIII, XXXV, XXXVI, XXXVIII, XXXIX, XL, XLI, XLIII, සහ XLIV යන පරිච්ඡේද.**

2. ඉල්ලුම්පත්‍ර, අනුබද්ධ ආකෘතියට අනුව ෆුල්ස්කැප් තීරුවක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. ෆුල්ස්කැප් තීරුවේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය.

3. විභාගය, විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීති රීති මෙම නිවේදනය අග පළකොට ඇත.

4. ඉල්ලුම්පත්‍ර 1973.9.17 දින හෝ ඉන් පෙර කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස්ට ලැබෙන පරිදි විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානියා මඟින් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කවර ඉල්ලුම්පත්‍රයක් වුවද, ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. යම්කිසි අපේක්ෂකයකුට විභාගයට, යටත් පිරිසෙයින් හත් දවසකට කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් ඔහු විසින් ඒ බව අප්‍රමාදව, කොළඹ 2, තැ. පෙ. 1503, මැලේ වීදියේ විභාග කොමසාරිස්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යවන ලිපිනය "විභාග" කොළඹ කියාවේ.) ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව විභාග කොමසාරිස්ට දැනුම් දෙන අතරම, පහත දැක්වෙන තොරතුරු ද සැපයිය යුතුය :—

(1) විභාගයේ නම :—
(2) සම්පූර්ණ නම :—
(3) සම්පූර්ණ ලිපිනය :—
(4) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කන්තෝරුව :—

6. ඉහත 5 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

7. හැඳුනුම් පත් භාවිතය සම්බන්ධයෙන් 71. 7. 20 දින සහ අංක 836 දරණ මගේ පොදු චක්‍රලේඛයෙහි නැවත දන්වා ඇති විභාග කොමසාරිස්ගේ 71. 6. 29 සහ අංක එස්ඊ/274 දරණ චක්‍රලේඛය කෙරෙහි සියලුම අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාවය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීම වනු ඇත.

8. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම් මත විභාග ගාස්තු ගෙවිය යුතුය :—

(අ) පළමු වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාව සඳහා—

| | | රුපියල් |
|---|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | ... | 30 |
| එක් විෂයයකට | ... | 10 |
| වාචික | ... | 5 |

අපේක්ෂකයින් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මඟින් ගාස්තු ගෙවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිට ඇති අපේක්ෂකයින්ට, ඉහත දැක්වෙන පරිදි අදාල ගාස්තු ගෙවීමට නියම වේ.

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 අගෝස්තු මස 10 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500,
කොළඹ.

**ඉල්ලුම් පත්‍රය**

වෛද්‍ය නිලධාරීන්, දන්ත වෛද්‍යවරුන් සහ ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 1973 ඔක්තෝබර්.

1. (අ) අගට යෙදෙන නම, මුල් අකුරු සමග :————.
   (ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :————.
2. පදවි නාමය :————.
3. වැඩ කරන ස්ථානය :————.
4. තැපැල් ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) :————.
5. ගන්නා විෂයයන් (අදාල නොවන්න කපා හරින්න) :————
   (අ) ආයතන සංග්‍රහය
   (ආ) ආරෝග්‍යශාලා සහ බෙහෙත් ශාලා පරිපාලනය
   (ඇ) ගිණුම්
   (ඈ) සිංහල (වාචික)
   (ඉ) දෙමළ (වාචික)

6. විභාගයට පෙනී සිටින්නේ කිනම් භාෂා මාධ්‍යයකින් ද :
:————

7. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටස් වශයෙන් පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන් වර්ෂය හා මාසය ද සඳහන් කරන්න :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

* මෙම ඉල්ලුම් පත්‍රයට අලවන මුද්දර මා විසින් අවලංගු කිරීමට පෙර වලංගු වූද, පාවිච්චි නොකරන ලද ඒවා බවද, ප්‍රකාශ කරමි..

| මුද්දර කොටුව |
|---|

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

ආයතන ප්‍රධානියාගේ සහතිකය

* අපේක්ෂකයා මුද්දර නිසි පරිදි අලවා අවලංගු කර ඇති බව සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

* ගාස්තු ගෙවීමට නොමැති විට කපාහැර දමන්න.

ඉදිරිපත් කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

විභාග කොමසාරිස්,
කොළඹ 2.

විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිව යුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතින්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළුවන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරුවිය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය භාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය භාගයක් ගතවනතුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකු ම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතින්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමඟ හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමඟ මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමඟ කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුව්හොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදුවනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුය. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඈමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම් ය. එකම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණන් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියෙන් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත් සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලිද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි සා පාර්සල් ආදියද fපයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර; බ්ලොටින් පේපර් යනාදියද විභාග ශාලාව තුළ සිටින කිසිවිටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීමද නොකළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණවූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවහොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටත යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේ පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාගාපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

## විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි:—

(i) විභාග පටන්ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්: ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව විභාග ශාලාධිපතිට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක වක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල් තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නාමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තරය ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයට උත්තර ලීවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නොලිය යුතුයි:

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවලට අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිවද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනෙන් ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ, වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

8-946 —73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

**ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ '' අ '' ඛණ්ඩයේ II වන පන්තියේ නිලධාරීන් සඳහාවූ කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය හා ගිණුම් පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1973 පෙබරවාරි**

රෝහල් ලිපිකරු සේවය පිළිබඳ ව්‍යවස්ථා මාලාවේ '' ඕ '' උපග්‍රන්ථයේ නියම කර ඇති 764 හා 71.06.25 දිනැති වි. කො. චක්‍රලේඛනයේ සංශෝධනය කරන ලද අන්දමට 1973.02.24 වැනි දින පවත්වන ලද පරීක්ෂණයේදී රෝහල් ලිපිකරු සේවයේ II ශ්‍රෙණියේ '' අ '' ඛණ්ඩයේ සිටින පහත සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් ඇති විෂයයන් ගෙන් සමත් වී ඇති බව පොදු දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

| | නම | සේවය කරන ස්ථානය | විෂයය |
|---|---|---|---|
| 1. | අහමත්, ඊ. ඒ. පී. ... | ... රිජ්වේ ආර්යා රෝහල, බොරැල්ල ... | ... කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය |
| 2. | ද අල්විස්, ඩබ්ලිව්. ඩී. ... | ... මහ රෝහල, රත්නපුර ... ... | ... කාර්යාල ක්‍රම හා කාර්ය පරිපාටිය |
| 3. | දූරගජවීර, ඩබ්ලිව්. එල්. ... | ... මහ රෝහල, රත්නපුර ... ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 4. | ගුනවර්ධන, එච්. ඩී. පී. ... | ... ළය චිකිත්සාගාරය, කළුතර ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 5. | කාරියවසම්, පී. ජී. කේ. ... | ... දිස්ත්‍රික් රෝහල, කොටගල ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 6. | රාජපක්ෂ, ඩී. එන්. ... | ... කො. රෝ. ම. අධි. කාර්යාලය ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ම පරිපාටිය |
| 7. | රණසිංහ, එම්. එල්. ... | ... දිස්ත්‍රික් රෝහල, අරණායක ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 8. | සමරවීර, ඒ. ... | ... දිස්ත්‍රික් රෝහල, අරණායක ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 9. | ෂන්මුගනාදන්, වී. ... | ... ළය රෝහල, වැලිසර ... ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 10. | සිරිමාන්න, එච්. ඩී. ජේ. | ... කො. රෝ. ම. අධිකාරි කාර්යාලය ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 11. | කුරෙසිරත්නම්, ඒ. ජේ. ... | ... රජයේ රෝහල, කයිට්ස් ... ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |
| 12. | විල්බට්, කේ. බී. ... | ... දකුණු කොළඹ රෝහල, කළුබෝවිල ... | ... කාර්යාල ක්‍රම සහ කාර්ය පරිපාටිය |

ජී. අමරසේන,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන),
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය.

8–907—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**සිංහල ගුරු විභාගය—1973 ඔක්තෝබර්**

ඉහත නම් සඳහන් විභාගය අම්බලන්ගොඩ, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, කොළඹ, දඹුල්ල, දික්වැල්ල, ඇහැළියගොඩ, ගල්ගමුව, ගාල්ල, හෝමාගම, හොරණ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුලියාපිටිය, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නාවලපිටිය, නිකවැරටිය, මීගමුව, නුවරඑළිය, පේදුරුතුඩුව, පොළොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව සහ වේයන්ගොඩ යන මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන අතර විභාගය ආරම්භ කරනුයේ 1973 ඔක්තෝබර් මස 13 වනද ය.

2. මෙම විභාගයට ඉදිරිපත් විය හැක්කේ සිංහල ගුරු විභාගයේ 'A' කොටසින් දැනට සමත් වී ඇති හෝ නිදහස් කර ඇති ගුරුවරුන්ට පමණි.

3. ආදර්ශ අයදුම් පත්‍රය මේ සමග ඇත. එය ඒ ආකෘතිය අනුවම අඟල් 8 × 13 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිටපත් කර (අයදුම්පත්‍රය ටයිප් ගසා පිළියෙල කරගන්නේ නම් ඉතා මැනවි.) කොළඹ 2, මැලේවීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් වෙත 1973 සැප්තැම්බර් මස 8 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. අයදුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ විභාගයේ නම ලිවීමට අමතක නොකරන්න. විභාග කොමසාරිස්ගේ හෝ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට එවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ ඇති ආකෘතියට සම නොවන ලෙස අයදුම්කරුවන්ට උවමනා අන්දමට පිළියෙළ කොට එවන අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ද භාරගනු නොලැබේ.

4. අයදුම්පත්‍රය විභාග කොමසාරිස් වෙත එවීමට ප්‍රථම 1969 ඔක්තෝබර් හා ඉන්පසු පවත්වනු ලබන සිංහල ගුරු විභාග සඳහා සංශෝධිත සිංහල ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රය කියවා මනා අවබෝධයක් ලබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට දන්වනු ලැබේ.

5. මෙම ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය ආණ්ඩුවේ පොත් ආයතනයෙන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු මධ්‍යස්ථානයෙන් ශත 40ක් ගෙවා මිලදී ගත හැකිය. තැපෑලෙන් අවශ්‍ය අයට රුපියල් 1.25ක මනිඕඩරයක් හෝ පෝස්ටල් ඕඩරයක් විභාග කොමසාරිස් නමට එවීමෙන් ලබාගත හැකි ය.

6. ඉහත 4 ඡෙදයේ සඳහන් සිංහල ගුරු විභාග ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රයට අමතරව පහත සඳහන් සංශෝධනයන් ද (මෙම) 1973 ඔක්තෝබර් සිංහල ගුරු විභාගය සඳහා වලංගු වේ.

1. 1 වන ඡෙදය :—විභාග පරිපාටිය :

විභාගය **A, B, C,** යනුවෙන් කොටස් තුනකින් යුක්ත වේ. එහෙත් දැන් පවත්වනු ලබන්නේ **B** හා **C** කොටස්වල පරීක්ෂණ පමණි.

2. 6 සිට 10 දක්වා ඡෙදවල දක්වා ඇති මෙම විභාගයේ ''ඒ'' කොටසින් නිදහස් කිරීම පිළිබඳ ව දී ඇති සියළු අනුග්‍රහ නවතා ඇත. 5 වන ඡෙදයේ සඳහන් පරිදි හැර ''ඒ'' කොටසින් නිදහස් කිරීම පිළිබඳ ව කෙරෙන අනිකුත් ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. 13 වන ඡෙදය :—ප්‍රතිඵල : විභාගයට පෙනී සිටි එක් එක් විෂයයෙන් සමත් හෝ අසමත් බව දැක්වෙන ප්‍රතිඵල සටහනක් සෑම අයදුම්කරුවකුටම නිකුත් කරනු ලැබේ. මෙම ප්‍රතිඵල සටහන් තැපැල් කර එවීම සඳහා සෑම අයදුම්කරුවකුම තමාගේ ලිපිනය නිවැරදිව ලියන ලද ලියුම් කවරයක් විභාග ශාලාධිපතිට භාරදීමට සැලකිලිමත් විය යුතුය. අවශ්‍ය ලියුම් කවර විභාගශාලාධිපති විසින් විභාග ශාලාවේ දී සපයනු ඇත.

යටකී ප්‍රතිඵල සටහන අනුව යම් අයදුම්කරුවකු විභාගයෙන් සමත් බව දැක්වුනද විභාගය සඳහා වූ සුදුසුකම් පරීක්ෂාකොට බලා සහතික පත්‍ර නිකුත් කරන තෙක් ප්‍රතිඵල තාවකාලික බව සැලකිය යුතු අතර යම් හෙයකින් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පසුව තහවුරු වුවහොත් එකී අයදුම්කරුගේ විභාගාපේක්ෂකත්වය සහ විභාග ප්‍රතිඵල ද අවලංගු කරනු ලැබේ. මත අවස්ථාවක දී එකී සාමාර්ථය ප්‍රයෝජනයට ගැනීමට කරන ඉල්ලීම් භාරගනු නොලැබේ.

### ආදර්ශ අයදුම්පත

### ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### 1973 ඔක්තෝබර් සිංහල ගුරු විභාගය B කොටස සඳහා අයදුම් පත්‍රය

විභාග අංකය :————.
(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහායි)
ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන වග :————.

1. අයදුම්කරුගේ පුරුදු අත්සන :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(පූජකවරයෙක් හෝ මෙනවියක් හෝ මහත්මියක් හෝ නම් ඒ බව සඳහන් කරන්න. ගුරුවරයෙකු වශයෙන් පත්වීමේදී ව්‍යවහාර කළ නම් නැතහොත් උප්පැන්න සහතිකයේ සඳහන් නම ලියන්න.)

3. ප්‍රවේශ පත්‍ර වැනි ලියවිලි එවිය යුතු ලිපිනය :————.
4. මධ්‍යස්ථානය (වඩාත්ම කැමති මධ්‍යස්ථානය පළමුවත් අනික්වා ඊට යටිනුත් ලියන්න.) (1) ————.
(ස්ථාන තුන ගැසට් නිවේදනයේ පළමුවැනි ඡෙදයේ දක්වෙන මධ්‍යස්ථානයන් අතරින් (2) ————.
තෝරාගත යුතු අතර ඒවා එකිනෙකට වෙනස් විය යුතුය.) (3) ————.
5. (අ) විභාග ගාස්තු සඳහා අවශ්‍ය මුද්දර මෙහි අලවන්න. (විභාග ගාස්තුව රු. 20කි).

(ආ) අලවා ඇති මුද්දරවල වටිනාකම රු. :————.

| මුද්දර අලවන කොටුව |
|---|
| මේ මුද්දර අයදුම්කරුගේ අත්සන හා දිනය යොදා අවලංගු කර සහතික කළ යුතුය. මුද්දර එකපිට එක නොසිටින සේ ඇල විය යුතුය. |

6. 1973 ජනවාරි මස 01 දිනට වයස :————.
7. දනට ලබා ඇති පත්වීම පිළිබඳ විස්තර :—

| | |
|---|---|
| (අ) පාසැල එහි ලිපිනය හා පාලනය | |
| (ආ) තත්වය (ස්ථිර ද, ආධුනික ද, වැඩ බලන හෝ තාවකාලික ද) | |
| (ඉ) අයදුම්කරු විසින් උගන්වනු ලබන විෂයයන් (සාමාන්‍ය පාඨශාලීය විෂයයන් ද, පාඨශාලීය විශේෂ විෂයයන්ද) | |
| (ඊ) අයදුම්කරු විසින් උගන්වනු ලබන මාධ්‍යය | |
| (උ) සතියකට උගන්වන පැය ගණන | |
| (ඌ) ලැබෙන මාසික වැටුප (ඒකාබද්ධ) | |

8. ගුරුවරයාගේ ලියාපදිංචි කළ අංකය හෝ එම පත්වීම පිළිබඳ නිකුත් කරන ලද ලියමනේ අංකය හෝ අධ්‍යාපන අධ්‍යක්ෂ තැන හෝ ප්‍රාදේශීය අධ්‍යාපන නිලධාරි තැන විසින් පත්වීම අනුමත කිරීම පිළිබඳ ලියමනේ හෝ විස්තර මෙහි සඳහන් කළ යුතුය :————.
9. සේවය නිසා නිදහසක් ඉල්ලන්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

නිදහස ඉල්ලන්නේ කවර කොටසින් ද :————.

10. පාසැලේ කළමනාකාර තැන විසින් හෝ මුල්ගුරු තැන විසින් හෝ මේ කොටස පිරවිය යුතුය :—

මෙම අයදුම්කරු පිළිබඳ ලිපි ලේඛනාදිය මා පරීක්ෂා කළ බවත්, එම ලිපි ලේඛනාදිය අනුව මෙම අයදුම්පතෙහි 2 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි හා 9 වැනි කොටුවල ලියා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි.

පාසැලේ නම :————.

එහි පාලනය :————.

ආණ්ඩුවේ පාසැලක්ද/අධ්‍යක්ෂ පාලිත පාසැලක් ද/අනුමත කළ ආධාර නොලබන පාසැලක් ද.

නම :————. අත්සන :————.

ලිපිනය :————. දිනය :————.

11. අයදුම්කරුගේ සහතිකය :—

මේ අයදුම්පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි.

මෙහි අලවා තිබෙන මුද්දර මා විසින් ඇලවූ බවත්, ඒවා මීට ඉහතින් පාවිච්චි නොකළාවූ ද දනට වලංගුවූ ද හොඳ මුද්දර බවත් මෙයින් සහතික කරමි. තවද විභාග කොමසාරිස් විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේ දී පිළිපැදිය යුතු අණපනත් වලටත් එකහව ඉන් බැඳී සිටීමට ද මෙයින් පොරොන්දු වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (සෑම අයදුම්කරුවෙකුම සඳහා) :————
වන මම ඉහත සඳහන් අයදුම්කරු ———— පදිංචි වූ කෙනෙකු බවද, මා ඔහු/ඇ හොඳාකාර අඳුනන බව ද 1973 ක්වූ ————
මස ———— වැනි දින මා ඉදිරියෙහි අත්සන තබන ලද බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ අත්සන :————.

තරාතිරම :————. ලිපිනය :————.

නම :————. දිනය :————.

**සැ.යු.**—අයදුම් පත්‍රයෙහි 12 කොටුවෙහි අයදුම්කරුගේ අත්සන සහතික කරවා ගැනීම පහත සඳහන් සුදුසුකම් ඇති අයෙකු ලවා කරවා ගත යුතුය.

ගුරුවරයෙකු ගුරුවරියක වන අයදුම්කරු විසින් තමන් ඉගැන්වීම කරන පාසැලේ ප්‍රධානියා ඉදිරියේ අත්සන තබා සහතික කරවා ගත යුතුය.

දනට ගුරුවරයෙකු/ගුරුවරියෙකු/නොවන අයදුම්කරු විසින් තමන්ගේ අත්සන සාමාදන විනිශ්චයකාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක, ගගන හෝ ගොඩ යුද්ධ හමුදවක කොමිසන් නිලධාරියෙකු, රු. 4,800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසැලක ප්‍රධානයෙකු හෝ එවැනි පාසැලක එම තත්ත්වයේ සිට විශ්‍රාමලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාමසේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමින්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

නියමිත සුදුසුකම් ඇති අයෙකු විසින් තම අත්සන සහතික කරන ලද බවට අයදුම්කරු වගබලා ගත යුතුයි.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973 අගෝස්තු මස 14 වන දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දීය.

8-951—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළු දෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.